ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No | ඔබේ අංකය<br>உமது இல.<br>Your No | දිනය<br>திகதி<br>Date 2024.05.03 |

පැමිණිලි පාර්ශවය :- කේ.එම්.තිලකරත්න මහතා,
අංක 4, දේවාළහිඳ,
අම්පාර.

වගඋත්තර පාර්ශවය :-

01. ඩී.එන්.බී.එන්.ප්‍රියන්ත මහතා ,
වනසත්ත්ව අඩවි සහකාර,
වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
අම්පාර.

02. කේ.එම්.සී.එන්.එස්.කේ.ගුණසේකර මහතා,
වනජීවී ක්ෂේත්‍ර සහකාර,
වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
අම්පාර.

03. එච්.ජී.දයාවංශ මහතා,
සිවිල් ආරක්ෂක භට,
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
අම්පාර

<u>පැමිණිලි අංකය :- **HRC/AM/111/22/B/PL**</u>

**පැමිණිල්ලේ සැළකිරීම :-**

ඉහත පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අම්පාර කාර්යාලය වෙත 2022.08.30 වන දිනැතිව පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, තමා 2022.08.24 වන දින රාත්‍රී මාළු ඇල්ලීම සඳහා ඉඟිණියාගල සේනානායක සමුද්‍රයට ගිය බවත්, එහිදී වනජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පැමිණ තමා අල්ලා ගත් බවත්, අනතුරුව අත් දෙකට හා කකුල් දෙකට මාංචු දමා තමාව බිම දමා ඔවුන්ගේ සපත්තු වලින්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ-04. / இல.14, ஆர்.ஏ.டி.மெல் மாவத்தை, கொழும்பு-04. / No.14, R.A. De Mel Mawatha, Colombo-04.
සභාපති / தவிசாளர் / Chaiman: 011-2505551
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / Email: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

තමාව පාගා පිට පැත්තට සපත්තු වලින් පහර දුන් බවත් සඳහන් කර ඇත. එසේම තමාගේ ඔළුවට හා මුහුණට අත්මිට් කර පහර දී රාත්‍රී කාලයේදී කැළයේ තබාගෙන සිට උදැසන වනජීවී කාර්යාලයට ගෙන ගොස් 2022.08.25 උදේ 11 ට පමණ අධිකරණයට ඉදිරිපත් කළ බව පවසා ඇත. අධිකරණයට පහරදීම පිළිබඳ තොරතුරු නොපැවසූ බවත්, ඇප ලබා ගෙදර පැමිණෙන විට ඔවුන්ගේ පහරදීම නිසා ඇස් වලට ලේ පුරා තිබූ බවත්, මාංචු දමා පෑගීම නිසා කකුලේ වළලුකර තුවාල වී තිබූ බවත්, මුළු ශරීරයම මෙන් ඉදිමිලා තිබුන බවත් පවසා ඇත.

තමාට රෝහලට යාමට මුදල් නොතිබූ බැවින් නිවසේ සිට 2022.08.27 වන දින ගමේ වෙද මහතා වන කේ.එම්.වීරරත්න වෙද මහතා වෙත ගිය විට ඔහු මෙම ඉදිමීම් හා තුවාල අනුව ශරීරයේ ඇතුලේ තුවාල තිබිය හැකි බැවින් තමාට ප්‍රතිකාර කල නොහැකි බව දන්වා 2022.08.27 දින තමාව අම්පාර රෝහල වෙත ගෙන ගොස් රෝහල්ගත කළ බවත්, එහිදී ඇස් වලට බෙහෙත් දමා කකුලේ තුවාලයට සැත්කමක්ද කළ බවත්, පහරදීම හේතුවෙන් තමාගේ ඇස් පෙනීම අඩු වී මතකයද අඩු වී ඇති බවත්, පවසා ඇත. තමාට පහර දුන් නිලධාරීන්ගේ ප්‍රධානියා භානුක නැමැති නිලධාරියෙකු වන අතර, අනෙක් නිලධාරීන් දෙදෙනා නොහඳුනන බවත් සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම :-**

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සිදු කළ වනසත්ව අඩවි සහකාර ඩී.එන්.බී.එන්.ප්‍රියන්ත වනජීවී ක්ෂේත්‍ර සහකාර කේ.එම්.සී.එච්.එස්.කේ ගුණසේකර සිවිල් ආරක්ෂක භට එච්.ජී.දයාවංශ යන අය මෙම සිදු වීමට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ ලබා දී ඇත.

එම කණ්ඩායම් භාරව කටයුතු කළ ඩී.එම්.බී.එන්. ප්‍රියන්ත මහතා 2022.08.24 දින තමා ක්ෂේත්‍ර සහකාර නලින්ද හා සිවිල් ආරක්ෂක නිලධාරී එච්.ජී.දයාවංශ යන අය සමඟ රාත්‍රී මුරසේවා කටයුතු කළ බව පවසා ඇත. රාත්‍රී 9.00 ට පමණ බැහැර යාම සටහන් කර අඩවි ආරක්ෂකගේ උපදෙස් පරිදි කාර්යාලයෙන් බැහැර වී බරවා පිටිය, නයිගල, කලූආර ප්‍රදේශ අවට පරීක්ෂා කරමින් කි.මී. 05 ක් පමණ ගිය විට, කලූආරට ඉහල ප්‍රදේශයේ පුද්ගලයන් කිහිප දෙනෙකු විදුලි පන්දම් එළි දල්වා ඝෝෂාකාරීව කතා කරනු ඇසුනු බවත් ඒ වන විට වෙලාව රාත්‍රී 12.00 පසු වී තිබූ බවත් දක්වා ඇත. එය නිරීක්ෂණය කරමින් තමන් රැඳී සිටියදී පුද්ගලයන් දෙදෙනෙකු විදුලි පන්දම් එළි දල්වා ගෙන තමන් සිටි දෙසට පැමිණි අතර, එම එන දෙදෙනා හා තමන් අතරට අලි රංචුවක් පැමිණි බවත්, එහිදී අලින් හා එම පුද්ගලයන් කලබල වූ අතර, ස්වල්ප වේලාවකින් අලි කැලයට ගිය විට පුද්ගලයන් දෙදෙනා තමන් දෙසට පැමිණි බවත්, එහි ඉදිරියෙන් පැමිණි පුද්ගලයා අත තුවක්කුවක් ඇති බව පසුපසින් ආ පුද්ගලයා අත වූ විදුලි පන්දම් එළියෙන් තමන් දුටු බවත්, එම පුද්ගලයන් රැඳී සිටි ස්ථානය සතුන් ගමන් කරන මාර්ගයක් වන අතර, එම ස්ථානයේදී මාර්ගය දෙපස රැඳී සිට ඔවුන් අත්අඩංගුවට ගැනීමට සූදානම්ව සිට මීටර් 10 ක් පමණ ඔවුන් නිලධාරීන් වෙත ළඟා වන විට තමන් වනජීවී නිලධාරීන් බව

හඳුන්වාදුන් විට ඉදිරියෙන් පැමිණි පුද්ගලයා තුවක්කුව තමන් දෙසට එල්ලකර වෙඩි තබව බවට තර්ජනය කරමින් පැන ගිය බවත්, අනෙක් පුද්ගලයා වැටි වැටී ටික දුරක් දුව ගොස් පැන යාමට උත්සහ කිරීමේදී, තමා සමඟ සිටි නිලධාරීන්ගේ සහය මත ඔහුව එනම් මෙම පැමිණිලිකාර කේ.එම් තිලකරත්න යන අයව අත්අඩංගුවට ගත් බවත් සඳහන් කර ඇත. එම පුද්ගලයාට වරද පහදා දී අත්අඩංගුවට ගත් විට ඔහු කිහිපවරක්ම තම අත්අඩංගුවෙන් මිදී යාමට උත්සහ කළ බවත්, ඔහුගේ පොර බැදීම් හේතුවෙන් ක්ෂේත්‍ර සහයක නලින් මහතාගේ වම් සුළඟිල්ල උළුක්වීමකට හා තම වම් අතේ පහළ පෙදෙසේ මස්පිඩු ඉරීමක් සිදු වූ බවත් පවසා ඇත. ඉන් පසු එම අයට මාංචු දැමූ අතර, ඔහු සමඟ සිටි අනෙක් පුද්ගලයා මොහු නිදහස් කරන ලෙසට හා එසේ නොවුනහොත් වෙඩි තබන බවට කැළෑවේ සිට තර්ජනය කරමින් නිලධාරීන් සිටි දෙසට වෙඩිල්ලක් තබන ලද බවත් සඳහන් කර ඇත. එබැවින් රාත්‍රියේ ගමන් කිරීම ආරක්ෂාකාරී නොවන බැවින් පැමිණිලිකරු උද්‍යාන කාර්යාලය වෙත රැගෙන ආ බවත්, ඔහුගේ අසනීප තත්වයන් විමසා සිටිය ද ඔහු ප්‍රතිචාරයක් නොදැක්වූ බවත් පවසා ඇත. රෝහලට යාමට තමා යෝජනා කළ ද ඔහු ඊට අකමැති වූ බැවින් ඔහුගේ ප්‍රකාශ සටහන් කර ගෙන උද්‍යාන භාරකරු විසින් 2022.08.25 වන දින පෙ.ව 10.30 ට පමණ වන සත්ත්ව හා වෘක්ෂ ලතා ආරක්ෂක ආඥා පනතේ වරදවල් වන රක්ෂිතයට අනවසරෙන් ඇතුළුවීම, ගල්ඔය නිම්න ජාතික උද්‍යානය තුළ වන සතෙකුට හානි සිදු කළ හැකි උපකරණ සන්තකයේ තබා ගැනීම, වනජීවී නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීම යන වරද යටතේ අම්පාර ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත් දක්වා ඇත.

ක්ෂේත්‍ර සහකාර කේ.එම්.සී.එන්.එස්.කේ.ගුණසේකර හා සිවිල් ආරක්ෂක භට එච්.ජී.දයාවංශ යන අයගේ ප්‍රකාශ ඉහත ප්‍රකාශකරුගේ ප්‍රකාශය හා සමානව ලබා දී ඇත.

**වෛද්‍යමය සාක්ෂි :-**

අම්පාර රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී එන්.ඩබ්.යූ.ඩී. මධුශානි මහත්මිය පැමිණිලිකරු පරීක්ෂා කර ලබාගත් අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව පැමිණිලිකරුගේ ශරීරයේ පහත තුවාල දක්නට ඇති බව සඳහන් කර ඇත.

01. 2 x 1 cm සිරීම් තුවාල නළලේ වම් පාර්ශවීය පැත්තට ඉහළින් පවතී.
02. 1X 1 cm සිරීම් නළලේ වම් පැත්තට ඇහි බැමට උඩින් ඇත.
03. 8 x 8 cm තැලීමක් දකුණු තට්ටම මත පවති.
04. 0.5 cm සීරීමක් දකුණු දණහිසෙන් පහළ කකුලේ ඉදිරිපස මැද කොටසක් පවති.
05. තුවාල අංක 04 ට මදක් ඉහළින් දකුණු කකුලේ ඉදිරිපස මැද කොටසේ මධ්‍ය අංශයට ඉහළින් 0.5cm සීරීමක් පවති.
06. 1x1 cmසීරීමක් වම් පාදයේ මැද වළලුකර මත පවති.
07. දකුණු පාදයේ පිටුපස විලුඹට ඉහළින් 2 cm ඉරීමක් දක්නට ලැබේ.

මේ අනුව ශරීරය පුරා බරපතල නොවන තුවාල දක්නට ලැබෙන බවත්, තුවාලවල ස්වාභාවය අනුව මොට අයුධ වලින් සිදුව ඇති බවත් දක්වා ඇත.

රෝගියා විසින් වෛද්‍ය වරයා වෙත ලබා දෙනු ලබන කෙටි රෝග ඉතිහාසයට අනුව, '2022.08.24 රාත්‍රී 11 ට පමණ සේනානායක සමුද්‍රය අසලදී වනජීවී එකේ භානුක මහතා විසින් තමාට අතින් පයින් පහරදුන් බවට' ප්‍රකාශ කර ඇත.

**පෞද්ගලික සාක්ෂි :-**

සේවාළහිඳ, කෙසෙල්වත්ත, 3/5 හි පදිංචි පාරම්පරික දේශිය වෛද්‍ය කේ.එම්.වීරරත්න මහතා 2022.08.30 වනදින කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දෙමින් 2022.08.25 වන දින මෙම පැමිණිලිකරු තමා වෙත ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණ වනජීවී නිලධාරීන් පහර දුන් බව පැවසු බවත්, රෝගියා පරීක්ෂා කිරීමේ දී ඇස්වලට ලේ පුරා රතු වී තිබු බවත්, පිට ප්‍රදේශයේ තැනින් තැන නිල් වී තිබු බවත්, දකුණු කකුලේ බොලටැහැ (වළලුකර) හන්දියට උඩින් ලොකු තුවාලයක් තිබෙනු දුටු බවත් දන්වා ඇත. රෝගියා පරීක්ෂාවේදී ඔහු තදබල පහරදීමකට ලක්ව ඇති බව තමාට පෙනෙන බවත්, මොළයේ ලේ නහර වලට හා ශරීරයේ අභ්‍යන්තර ඉන්ද්‍රියන්ට හානි සිදුව තිබෙන්නට ඉඩ ඇති බැවින් තමා ඔහුට ප්‍රතිකාර නොකර රෝහල් ගත වන ලෙස උපදෙස් දුන් බවත් පවසා ඇත.

**විමර්ශනයේදි අනාවරණය වී ඇති කරුණු :-**

01.2022.08.25 වන දින පැමිණිලිකරු වනජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් (වගඋත්තර පාර්ශවීය) වන සත්ත්ව හා වෘක්ෂ ලතා ආරක්ෂක ආඥා පනතේ වරදවල් වන රක්ෂිතයට අනවසරෙන් ඇතුළුවීම, ගල්ඔය නිම්න ජාතික උද්‍යානය තුළ වන සතෙකුට හානි සිදු කළ හැකි උපකරණ සන්තකයේ තබා ගැනීම, වනජීවී නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීම යන වරද යටතේ අත් අඩංගුවට ගෙන ඇත.

02.අත්අඩංගුවට ගත් පැමිණිලිකරු 2022.08.25 වන දින අම්පාර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අතර, අත්අඩංගුවට ගත් පැමිණිලිකරු අධිකරණයට ඉදිරිපත් කිරීමට ප්‍රථම වෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් කර නොමැති බව ආනාවරණය වේ.

04. 2022.08.25 දිනම පැමිණිලිකරු ඇප මත නිදහස් කර ඇති අතර, පැමිණිලිකරුගේ ප්‍රකාශ අනුව ඔහු 2022.08.27 වනදින දේශිය පාරම්පරික වෛද්‍ය කේ.එම්. වීරරත්න මහතාගෙන් ප්‍රතිකාර ලබාගැනීමට ගොස් ඇති බව හා කේ.එම්.වීරරත්න මහතා ඔහු රෝහල් ගත කර ඇති බව අනාවරණය වේ.

05. අම්පාර රෝහලේ අධිකරණ වෛද්‍යවරයාගේ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පැමිණිලිකරුගේ තුවාල හා සිරීම් 07 ක් නිරීක්ෂණය වී ඇති බව හා ශරීරය පුරා බරපතල නොවන තුවාල දක්නට ලැබන බවත්, එම තුවාල මොට අයුධ භාවිතයෙන් සිදුව ඇති බවත් සඳහන් කර ඇත.

06. වගඋත්තර පාර්ශවීය නිලධාරීන් සැකකරුගේ අත් වලට පමණක් විලංගු දැමූ බව සිය ප්‍රකාශ වලදී හා පරීක්ෂණයේ කරුණු දැක්වුවද 2022.08.25 වනදින වනජීවි නිලධාරීන් පැමිණිලිකරුගෙන් ගත් ප්‍රකාශයේදී කකුල් දෙකට ද මාංචු දැමූ බව හා මාංචු නිසා තුවාල ලැබූ නිසා කකුල් දෙකට දමා තිබූ මාංචු ගැලවූ බවත් සඳහන් කර ඇත.

07. වගඋත්තර පාර්ශවීය නිලධාරීන් සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට රැදී සිටීමේ දී අලියෙක් ඔවුන් දෙපාර්ශවය අතරට පැමිණි බව හා මෙම පැමිණිලි පාර්ශවය පසුපස එලවා ගිය බව සඳහන් කර ඇති අතර, පැමිණිලිකරු වන ජීවි නිලධාරීන් හා පොර බැදීමක් සිදුකළ බවට වනජීවි නිලධාරීන් කරනු ලබන කරුණු දැක්වීම පැමිණිලිකරු වනජීවි නිලධාරීන්ට ලබාදුන් ප්‍රකාශයෙන් ද තහවුරු වන බව අනාවරණය වේ.

08. වගඋත්තර නිලධාරීන් පැමිණිලි පාර්ශවය අත්අඩංගුවට ගැනීම සිදුකර ඇත්තේ, වනය තුළදී වන අතර, එහිදි අලියෙකු පන්නා ගෙන ඒමේදී දිව යාම හා වන ජීවි නිලධාරීන් හා පැමිණිලිකරු පොර බැදීමක් සිදු වූ බව පැමිණිලිකරු මෙන්ම වගඋත්තර පාර්ශවීය නිලධාරීන්ද සඳහන් කර ඇත. ශරීරය පුරා දක්නට ලැබෙන බරපතල නොවන තුවාල එම අවස්ථාවේදී ඇතිවිය හැකි ය. එසේවුවත් තුවාල ඇතිවීමේ ස්වාභාවය පිළිබඳව වෛද්‍ය මතයේ පැමිණිලිකරුගේ තුවාල මොට අයුධ වලින් සිදුව ඇති බව දක්වා තිබීම මත වගඋත්තර පාර්ශවිය නිලධාරීන් විසින් පැමිණිලිකරුට පහරදුන් බවට කරන චෝදනාව බැහැර කළ නොහැකිය. එසේම වගඋත්තර පාර්ශවීය නිලධාරීන් සැකකරු අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරිම සිදුනොකිරීම ද ගැටළු සහගත වේ.

09. පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ලට අනුව, තමා රාත්‍රීකාලයේදී ඉහිනියාගල වැවේ මාළු ඇල්ලීම සඳහා ගිය බවට දක්වා ඇති අතර, එහි තවත් අයකු හෝ පිරිසක් සමඟ මාළු ඇල්ලීම සඳහා ගිය බවක් දක්වා නොමැත. මෙහිදී රාත්‍රී කාලයේදී රක්ෂිතයකට ඇතුළු වීම නීත්‍යානුකූල කටයුත්තක් නොවන අතර, වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ වලට අනුව පැමිණිලිකරු සන්තකයේ අත්පොරවක්, යකඩ පිහියක්, කළු පැහැති විදුලි පන්දම් 2 ක්, ගිණිපෙට්ටි දෙකක් හා ප්ලාස්ටික් බෝතලයක නීති විරෝධී මත්පැන් ස්වල්පයක් තිබී ඇති බවට දක්වයි. එම භාණ්ඩ අතර මාළු බෑම සඳහා යොදා ගනු ලබන භාණ්ඩ හා කිසිදු සම්බන්ධතාවයක් නොමැති අතර, මාලු බෑම සඳහා යොදා ගන්නා උපකරණ තිබූ බවක් නිරීක්ෂණය නොවේ. එබැවින් පැමිණිලි පාර්ශවය විසින් සඳහන් කරනු ලබන 'මාළු ඇල්ලීම සඳහා ඉහිනියාගල වැවට ගිය බවට' ප්‍රකාශය පිළිගත නොහැක.

10. තවද, පැමිණිල්ලට අදාළව සිදුකරන ලද 2023.02.17 දිනැති පරීක්ෂණයේදී කරුණු ඉදිරිපත් කරමින් පැමිණිලි පාර්ශවය සඳහන් කර ඇත්තේ, "තමන්ට අයත් හරක් නැති වූ බැවින් එම හරක් සෙවීමට ගිය අවස්ථාවේදී වනජීවී නිලධාරීන් විසින් තමාව අත්අඩංගුවට ගන්නා ලද බවයි." මේ අනුව පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශයන්හි යම් යම් පරස්පරතා පවතින බව නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම අත්අඩංගුවට ගැනීම නීති විරෝධී අත්අඩංගුවට ගැනීමක් ලෙසට ඉහත කරුණු සලකා බැලීමේදී තහවුරු වී නොමැත.

11. කෙසේ වුවද, මාළු ඇල්ලීම හෝ වගඋත්තර පාර්ශවය දක්වනු ලබන වෙනයම් නීත්‍යානුකූල නොවන කටයුත්තක් සඳහා හෝ පැමිණිලිකරු රාත්‍රී කාලයේදී අදාළ රක්ෂිතයට ඇතුළු වී ඇති බවට හා එහිදී වගඋත්තර පාර්ශවයේ අත්අඩංගුවට පත්ව ඇති බවට තහවුරු වන අතර, අත්අඩංගුවට ගැනීමේදී, වගඋත්තර පාර්ශවීය නිලධාරීන් වෙතින් පැමිණිලිකරුට පහරදීමක් සිදුව ඇති බවද අධිකරණ වෛද්‍ය වාර්තා සහ පරීක්ෂණයේ දී ඉදිරිපත් වී ඇති සමස්ත කරුණු අනුව සනාථ වෙයි. පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූල බව පෙනී ගියද, අත්අඩංගුවට ගත් සැකකරුවකුට හෝ යම් තැනැත්තෙකුට පහරදීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය උල්ලංඝනය කිරීමක් වේ.

නිගමනය :-

මෙම සිදුවීමේදී 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති 11 වන ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට අදාළව උල්ලංඝනය කර ඇති බව කොමිෂන් සභාව නිගමනය කරයි.

**ඒ අනුව, පහත සඳහන් නිර්දේශය කර සිටී.**

1. **පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීම රාත්‍රී කාලයේදී රක්ෂිතයක් තුළට ඇතුළුවීම හා වන සත්වයෙකුට හානි කළ හැකි උපකරණ සන්තකයේ තබාගැනීම හේතුකොටගෙන වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත ප්‍රකාරව සිදුකර තිබුනද, මෙකී සමස්ත කරුණු අනුව, ඉහත පැමිණිලිකාර කේ.එම් තිලකරත්න යන අයට 1- 3 දක්වා වූ වගඋත්තරකාර පාර්ශවය විසින් පහරදීමක් කර ඇති බවට වෛද්‍ය වාර්තා අනුවද අනාවරණය වන බැවින්, එම වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීමට වනජීවි හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යංශයේ ලේකම් විසින් කටයුතු කළයුතුය.**

2. **තවද, 1-3 දක්වා වූ වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකාර කේ.එම් තිලකරත්න මහතා වෙත රු. 7,500/-ක මුදලක් ගෙවිය යුතුය.**

2024.06.12 දිනට පෙර ඉහත පරිදි කටයුතු කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- 01. පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය
ගරු අමාත්‍යතුමිය,
වනජීවි හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය,
1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

02. ලේකම්, - **ඉහත 01 නිර්දේශය අනුව කටයුතු කිරීමට**
වනජීවි හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය,
1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

03. මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය, අම්පාර.

**සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක් " පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැළැස්විය යුතුය.**

B/